ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී සිව්වන වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2018 ජනවාරි/ පෙබරවාරි

ආර්ථික විද්‍යාව

**ECON 4273.01 – සෞඛ්‍ය ආරක්ෂණය පිළිබඳ ආර්ථික විශ්ලේෂණය**

---

කාලය: පැය 02 යි
ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

1) අ. සෞඛ්‍ය හා සෞඛ්‍ය ආරක්ෂණය අතර ඇති වෙනස දක්වමින් සෞඛ්‍ය නිෂ්පාදන ශ්‍රිතය පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ. 'ප්‍රශස්ථ සෞඛ්‍ය සේවා සැපයුම' යන්න සෞඛ්‍ය විශේෂඥයින්ගේ සහ ආර්ථික විද්‍යාඥයින්ගේ දෘෂ්ටිකෝණයන්ගෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

2) අ. අවදානම හා අවිනිශ්චිතතාව යන ගැටළුව සෞඛ්‍ය ආරක්ෂණ වෙළෙඳපොළට බලපාන අයුරු සහ වෙළෙඳපොළ තුළ මෙම ගැටළුව විසඳා ගන්නා අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ. සෞඛ්‍ය රක්ෂණ වෙළෙඳපොළ තුළ ඇති ගැටළු මොනවාදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

3) අ. පුද්ගලයින් සෞඛ්‍ය සඳහා ඉල්ලුම් කරන්නේ ඇයි? සුදුසු ආදර්ශයක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ. සැපයුමෙන් ඇඳුණු ඉල්ලුමක් යනු කුමක් ද? සෞඛ්‍ය ආරක්ෂණ වෙළෙඳපොළ තුළ මෙහි අදාළත්වය කෙබඳු ද? (ලකුණු 10)

→

4) අ. පුද්ගලයෙකු රෝගී වීම හා බැඳුණු පිරිවැය සාර්ව ආර්ථික සන්දර්භය තුළ පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ. සෞඛ්‍ය ආරක්ෂණ වෙළෙඳපොළ තුළ බාහිරතාවල බලපෑම කෙබඳු ද? වෙළෙඳපොළ තුළ මෙම ගැටළුව විසඳා ගන්නේ කෙසේ ද? (ලකුණු 10)

5) අ. ආර්ථික විද්‍යානුකූල දැක්මකින් සෞඛ්‍ය ආරක්ෂණ වැඩසටහන් ඇගයීමේ අවශ්‍යතාවය පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ. පහත දැක්වෙන සෞඛ්‍ය ආරක්ෂණ වැඩසටහන් ඇගයීමේ ක්‍රම පැහැදිලි කරමින් ඒවා අතර සමාන අසමානකම් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(i) පිරිවැය ඵලදායිතා විශ්ලේෂණය (Cost effectiveness analysis – CEA)
(ii) පිරිවැය උපයෝගිතා විශ්ලේෂණය (Cost utility analysis – CUA)
(iii) පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය (Cost benefit analysis – CBA)

6) පහත මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න. (ලකුණු 10 බැගින්)

(i) ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය දර්ශකවල තත්ත්වය
(ii) වයස්ගත වූවන්ගේ සෞඛ්‍ය ගැටළු විසඳිය හැකි විවිධ ක්‍රම